# ගල්ඔය පසුබිම

ගල්ඔය මිටියාවතට අදාල ඓතිහාසික පසුබිම හදාරන්නෙකුට පැහැදිලිව අවබෝධවන කරුණක් නම් වාරිමාර්ග කටයුතු පිළිබඳ දැනුමක් ලබා සිටි ජනතාවක් ක්‍රි. පූ. 3 වන සියවසේ දී එහි මුලින්ම වාසය කළ බවය. කල් යාමේදී කැලෑවල වැඩී තිබුණු වෘක්ෂලතා ආදිය කපාදමා එළිපෙහෙළි කොට එවකට පහත් බිම් ප්‍රදේශයේ පිහිටි පට්ටිපොල් ආරු නම් ජල මාර්ගයෙන් කුඩා වැව් විශාල සංඛ්‍යාවක් ඉදිකරන ලදී. පට්ටිපොල් ආරු නමින් එවකට හැඳින්වූ ජල මාර්ගය දැනට ගල්ඔය නමින් හඳුන්වනු ලැබේ. මෙසේ ඇති වූ දියුණුව දිගටම පවත්වාගත නොහැකිවීම අභාග්‍යයක් ලෙස සැලකිය හැකිය.

ගල්ඔය ව්‍යාපෘතියේ වැඩ කටයුතු භාරව ක්‍රියා කිරීමට ගල්ඔය සංවර්ධන මණ්ඩලය පිහිටුවා ගැනීමට පෙර ගල්ඔය මිටියාවතෙහි අක්කර 30,000 ක් පමණ විශාල බිම් ප්‍රමාණය වගා කරන ලද්දේ පට්ටිපොල් ආරු නම් ජල මාර්ගයෙන් ද එයට සම්බන්ධ වැව් වලින්ද සපයන ලද ජලයෙනි. ඉතිරි බිම් ප්‍රමාණය වැසි ජලයේ ආධාරයෙන් වගා කරන ලදී.

වර්ෂ 1936 දී ගල්ඔය වාරිමාර්ග පද්ධතිය සම්පූර්ණ පරීක්ෂණයකට භාජනය කරන ලදුව, එම පරීක්ෂණයෙන් අනාවරණයවූ කරුණු පහත දැක්වේ, පළමුකොට ගල්ඔය ජලාශයෙහි සම්පූර්ණ ජල ප්‍රමාණය ඉඩම් අක්කර 26,000 ක් වගා කිරීමේ අවශ්‍ය ප්‍රමාණයට වඩා බෙහෙවින් අධික වීම, දෙවැනිව, සත කැළෑව වඳවීම හේතුකොට ගෙන ඇතිවූ ජලස්කන්ධය පාලනය කළ නොහැකි තරම් විශාල වීමෙන් සෑම වර්ෂයකම අවසානයේ දී පමණ අහිතකර අන්දමේ ජල ගැලීම් ඇතිවීම, තුන්වැනිව වැව වල අඩංගු අක්කර අඩි 40,000 ක් තරම්වූ ජලප්‍රමාණය අධික නියගය පවත්නා වර්ෂයක වියලි කාලයේදී වගා කටයුතු සඳහා අවශ්‍ය වන ජලය සැපයීමට ප්‍රමාණවත් නොවීම.

ගල්ඔය ජලාශය නිර්මාණය කිරීම සඳහා වේල්ලක් ඉදි කිරීම බෙහෙවින්ම සුදුසු ස්ථානයක් ඉඟිනියාගල ඇතිබව කලින් පවත්වන ලද පරීක්ෂණයකින් හෙළිවී තිබුණා. මෙම ස්ථානයෙහි වේල්ලක් ඉදි කළහොත්, වගා කන්නයේ වර්ෂාවෙන් ලැබෙන ජලයත් ජලගැලීම් වලින් ලැලෙන ජලයත් එක් රැස්කොට තබා, වගා කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණය අනුක්‍රමයෙන් ලබාදිය හැකිවනු ඇතැයි අපේක්ෂා කරන ලදී. මේ පිළිබඳව වර්ෂ 1942 අවසානයේදී නිමාවට පත්වූනු සවිස්තර විමර්ශන වලින් ලැබුණු තොරතුරු

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
ආර්. ද ඇස්. ආරියබන්ධු
විසිනි.

අනුව අක්කර අඩි 740,000 ක ජල ස්කන්ධයක් වර්ග සැතපුම් 30 ක් විශාල වැවක ගබඩා කර තැබිය හැකි බවද මේ මගින් අක්කර 120,000 ක් විශාල ඉඩම් ප්‍රමාණයක ඒක කන්නයක දී වී වගා කිරීමට ප්‍රමාණවත් ජලය සැපයෙන බවද අනාවරණය විය.

ඉනික්බිතිව වැඩි කලක් ගත වන්නට පෙර, බහු කාර්ය වේලි පිළිබඳව විශේෂඥයෙකු ලෙස ජාත්‍යන්තර වශයෙන් කීර්තිගට පත්ව සිටි ආචාර්ය ජේ. ඇල්. සැවේජ් මහතාගේ නිර්දේශය අනුව මෙම යෝජනා ක්‍රමයට රජයේ අනුමැතිය ලැබිනි.

මහ කන්නයේදී ලැබෙන වර්ෂා පතනයක් එකිනෙක සසඳා බලන

(31 වන පිට හා සම්බන්ධයි)

(10 වන පිට හා සම්බන්ධයි)

විට, මෙහා කන්නයේ වර්ෂාපතන බෙහවින්ම අධික ය. වැසිය කාලයේදී ලැබෙන ජලය ප්‍රයෝජනයට ගත් පසු ඉතිරි වන ප්‍රමාණය ගබඩා කිරීම, වියලි කාලයේදී එම ජලය වගා කටයුතු සඳහා උපයෝගීකර ගැනීමටත් එසේ කිරීමෙන් වෙරළබඩ පෙදෙස්වල තැනිතලා ඉඩම් ජල ගැල්මට ගොදුරු වීම වැලැක්වීමටත් ඉඩකඩ සලසයි.

ඉඟිනියාගල වේල්ල තැනීමෙ කාර්යභාරය සුප්‍රකට ඇමෙරිකානු ඉංජිනේරු සමාගමක් වන සැන්ප්‍රැන්සිස්කෝහි මොරිසන් කුන්ඩ්සන් සමාගම වෙත 1947 අගභාගයේ දී පවරන ලදුව, එම කටයුතු 1949 දී ආරම්භ විය. කේ. වී. ඒ. (කිලෝ වොල්ට ඇම්පියර්) 5000 ක ධාරිකාවක් සහිත විදුලි බලාගාරයක් ද ඇතුළුව ප්‍රධාන වේල්ලට ද පිටවානේ වේල්ලට ද අදල ඉදිකිරීම් කටයුතු 1951 නොවැම්බර් මාසයේ දී නිම වනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි ශීඝ්‍ර මාරු ක්‍රමයක් නියම කිරීම රජයේ විවිධ දෙපාර්තමේන්තුවල නියෝජිතවරුන්ගෙන් සමන්විත උපයෝගිතා කමිටුවක් මගින් කළ හැකි වෙතැයි මෙම යෝජනා ක්‍රමයේ මුල් අදියර වලදී අදහස් කරන ලද්දේය. මෙකී ශීඝ්‍ර මාරු ක්‍රමය ඇති කිරීමෙන් බලාපොරොත්තු වූයේ පසෙහි සශ්‍රීක භාවය රඳවා තබා ගැනීමටත් ඉඩම් හා ජලය අරපිරිමැස්මෙන් යුක්තව පාවිච්චි කෙරෙන බවට වග බලා ගැනීමත් ය. කර්මාන්ත දිරි ගැන්වීම ද වගා කටයුතු කිරීමේ නවීන ක්‍රම භාවිත ය ද පසුව සලකා බැලීමට නියමිතව තිබුණි. ශීඝ්‍ර මාරු ක්‍රමය පදනම් කොට වගා කටයුතු පිළිබඳව මේ ආකාරයෙන් පාලනයක් ඇති කිරීම ස්වාධීනව ක්‍රියාකරන රජයේ දෙපාර්තමේන්තු මගින් සංවර්ධන කාර්යයන් භාරගෙන ඇති කුඩා ජනපද යෝජනා ක්‍රම වල ක්‍රියාත්මකවන වගා ක්‍රමවලට වඩා වෙනස් වන්නේ ඉතා ස්වල්ප වශයෙනි.